(4)

30 . 11 . 2016

# ද මැසිනොද් විද්‍යාලය කඳාන
# De Mazenod College - Kandana

## සිංහල භාෂාව

පැය 3

12 ශ්‍රේණිය

❖ 1,2,3 ප්‍රශ්නවලට අනිවාර්යයෙන්ම පිළිතුරු සැපයිය යුතු වේ.
❖ 4,5,6 යන ප්‍රශ්න වලින් ප්‍රශ්න දෙකක් පමණක් තෝරාගෙන පිළිතුරු සපයන්න.

Resource De Mazenod College Kandana

1. (අ) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

'කලාව කලාව සඳහාය' යන ප්‍රකාශනය ද, 'රසවත් වැකිය කාව්‍ය නම් වේ.' යන අදහස ද අගය කළ යුතු වේ. එයින් අදහස් වන්නේ කලා කෘතියකින් සහෘදතාව තියුණු කරන රසාස්වාදනයක් හා වින්දනයක් ලැබීම ය. කලාවේ ප්‍රධාන හා අප්‍රධාන අරමුණු තිබිය නො හැකි ය. පැවතිය යුත්තේ එක් ප්‍රධාන අරමුණකි. එය අවසාන මෙන් ම එක ම අරමුණ වේ. එනම් තියුණු රසාස්වාදයක් හෙවත් වින්දනයක් ලැබීම යි. ඇතැම් සාහිත්‍ය විචාර මත අනුව, සාහිත්‍යයික කලානිර්මාණ සමාජ, දේශපාලන, සංවාද මත ගොඩනැඟුණු උත්තර සංවාදයක් ලෙස හෝ බුද්ධි බලයක් නැතහොත් ඥාන මාර්ගයක් ලැබ දෙන හෝ සමාජ යථාර්ථය පිළිබිඹු කෙරෙන කැටපතක් හෝ ලෙස පිළිගැනීම මුළුමනින් ම බැහැර කළ යුතු ය. කලාකරුවා අපූර්ව වින්දන පථයක් ඔස්සේ සහෘදයා කැඳවා ගෙන යන මාර්ගෝපදේශකයකු පමණකි. මේ අරමුණු පදනම් කරගෙන ධ්වනි සිද්ධාන්තය හා පාරිභාරික විචාරය උපයෝගී කරගත හැකි ආකාරය විමසිය යුතු ය.

1. මෙහි කලාකරුවා හඳුන්වා දී ඇත්තේ කවරෙකු වශයෙන් ද?
2. කලාවේ ප්‍රධාන හා එක ම අරමුණ කුමක් ද?
3. ලේඛකයා මෙම ගද්‍ය පාඨය තුළ අගය කරන්නේ කුමන අදහස් ද?
4. ඇතැම් සාහිත්‍ය විචාරකයින් බැහැර කළ යුතු යයි පවසන කරුණු 2ක් දක්වන්න.
5. සහෘදතාව, පාරිභාරික විචාරය යන පදවල අරුත් දක්වන්න.

*(ලකුණු 10)*

(ආ) පහත දැක්වෙන පාඨය කියවා එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කර ලියන්න. එහි අග වචන සංඛ්‍යාව ද ලියන්න.

'ආකෘතික විචාරය' යනුවෙන් හැඳින්වෙන්නේ මේ ශත වර්ෂයේ දී බෙහෙවින් බලපෑ විචාරාත්මක මූලධර්මයකි. සාහිත්‍ය කෘතිය එ පවත්නා ලෙසින් ම පරිශීලනය කිරීම ආකෘතික විචාරයේ පරමාර්ථයකි. මේ විචාරකයන් තම අවධානය සර්වප්‍රකාරයෙන් ම යොමු කරන්නේ කෘතියේ ආවේණික ස්වරූපය කෙරෙහි ය. ඔවුහු කෘතියෙන් පිට ඇති සියල්ලක් ම බැහැර කරති. මීට පෙර පහළ වූ විචාරවාදයන් කෘතියෙන් බැහැර ව චරිතාපදාන, මනෝවිද්‍යාව, ඉතිහාසය, සමාජ විද්‍යාව යනාදිය කෙරෙහි දිව යන්නේ යැයි මොවුහු තර්ක කරති. ප්‍රතික්‍රියාවාදී විචාරකයාගේ අවධානය කෘතියෙන් බැහැර ව තම ආධ්‍යාත්මය දෙසට ම යොමු වෙතැයි ඔවුහු පවසති. කෘතියෙන් බැහැර, වස්තු විෂයට මුල් වූ හේතුන් ඉන් සහෘදයන්ගේ සිත් තුළ ජනිත වන ඵලත් පරීක්ෂා කොට හෙළි කිරීම විචාරකයාගේ පරම කාර්යය නො වේ යනු මොවුන්ගේ විශ්වාසයයි. වස්තු විෂයය පැහැදිලි කිරීම, විචාරකයාගේ පරම කාර්යය සේ ඔවුහු සලකති. මේ පැහැදිලි කිරීම හා විග්‍රහ කිරීම තුළින් කෘතිය පිළිබඳ විනිශ්චයක් මතු ව එයි. මේ සඳහා නීති රීති ද විචාර සිද්ධාන්ත ද අනවශ්‍යය යනු ඔවුන්ගේ අදහසයි. විචාරකයා කරන්නේ තනි තනි කෘති විග්‍රහ කිරීම යි. කෘතියක් වනාහි අනන්‍යසදෘශ වූ වස්තුවකි. එහෙයින් එය විනිශ්චය කිරීමට, කලින් උගත්, සංකල්ප හා නීති රීති නො ගැළපේ. කෘතියක් විග්‍රහ කළ යුත්තේ කෙසේ ද යනු කෘතියෙන් ම ගම්‍ය වේ. සාහිත්‍යය, සුඛාන්ත, ශෝකාන්ත ආදී වශයෙන් ගණවලට බෙදීමට ආකෘතික විචාරයෙන් ඉඩක් නො ලැබේ. අනන්‍යසදෘශ ලක්ෂණ ඇති කලා කෘති ගණවලට බෙදිය හැක්කේ කෙසේ ද? මේ නිසා විචාරය සඳහා නීති රීති පැනවීම ද උගහට ය.

*(ලකුණු 15)*

(6)

(02) පහත සඳහන් මාතෘකා අතුරින් එකක් තෝරාගෙන වචන 350ක රචනාවක් ලියන්න.

01- මත්ද්‍රව්‍ය උවදුර සහ රටේ අනාගතය.
02- ජාතීන් අතර සමගිය ගොඩ ගැනිය හැක්කේ කෙසේද ?
03- ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය
04- පෞරාණික වස්තූන් සුරැකීමේ වැදගත්කම
05- ගොඩ නැංවිය යුතු රසවින්දනාත්මක සාහිත්‍යය
06- සුරැකිය යුතු අපේ සාරධර්ම

ලකුණු 25

(03) පහත සඳහන් කවිය පිලිබඳ රසාස්වාදයක් ලියන්න.

අට වයස් නොදරුවා
හැට පිරුනු කලු සමින්
වැසුනු ඇට සැකිල්ලකි

එහෙත් ඔහු සිනාසෙයි
දත් පුරා සිනාසෙයි
කට පුරා සිනාසෙයි
ඇට පෙනන මුහුන මත
දෙකක නෙත් දික් ගැහුනු
සිනාවෙන් ඔහු මුහුන
පුරුදු නැති සිත්තරකු
නොංචි කෝලමට කැපූ
සරිය වෙස් මුහුනකට
වමතෙ පොල් කටුවේ සිට
කට ලඟට ගොස් වැයෙන
ලී කැබැල්ලකි සුරත
බට්ටෙක් මෙන් ඔරලෝසුවේ
ගනන් බලා තුන් විඩයක්
උඩහට පහලට ගිය අත
හිස් පොල් කටුවේ
එකවර නැවතීන
" පොඩි ළමයෝ
බත්
ඉවරද කාලා "

පුදුමයෙන් මෙන් බලා මා දෙස
දෙකන තෙක් දික් සිනා පාලා
වීසි කොට පොල් කටුව කානුවේ
පිස දමයි අත ඉරුනු සරමේ

ලකුණු 20

(04) මළගිය ඇත්තෝ නවකතාවෙන් නිරූපණය වන්නේ සංස්කෘතීන් දෙකක් අතර ඇතිවන ගැටුමකි. මෙම කියමන නිදසුන් දෙමින් විමසන්න.

ලකුණු 15

(05) " සද්ධර්මරත්නාවලි කතුවරයා සිද්ධි හා අවස්ථා නිරූපණයේ සමතෙකි " මෙම අදහස පිලිබඳ නිදසුන් ආශ්‍රයෙන් ඔබගේ අදහස් දක්වන්න.

ලකුණු 15

(06) ගිරා සන්දේශ කතුවරයාගේ කවිත්වය අදාල වර්ණණා දෙකක් ආශ්‍රයෙන් නිදසුන් දෙමින් විස්තර කරන්න.

ලකුණු 15